(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 363.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 මැයි මස 22 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2224/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (5)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන්ම නිවාස 15000කින් සමන්විත නව නිවාස යෝජනා ක්‍රම තුනක් ආරම්භ කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් ව්‍යාපෘතිවල පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3223/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 ජනවාරි මස 01 වැනිදා සිට මේ දක්වා විශ්‍රාම වැටුප් හිමි රජයේ සේවකයන් හට වැටුප් වැඩිවීම් ලැබුණු දිනයන් සහ එක් එක් අවස්ථාවේදී වැඩි කරන ලද මුදල් ප්‍රමාණයන් කවරේද;

(ii) වැටුප් වර්ධකය හිමි දැනට සේවය කරන සමස්ත රජයේ සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) 2005 ජනවාරි මස 01 වැනිදා සිට මේ දක්වා එක් එක් වර්ෂය තුළ වැඩි කරන ලද දීමනා කවරේද;

(iv) දීමනා වැඩි කිරීම මගින් ඇති වූ සමස්ත බලපෑම සහ එකී බලපෑම ඇති වූ රජයේ සේවකයන් සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3332/’12

3.

ගරු රෝසි සේනානායක මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2008 - 2012 කාල පරිච්ඡේදයේදී ළමා අපයෝජන සම්බන්ධයෙන් පොලිස් කාන්තා හා ළමා කාර්යාංශය වෙත ලැබූ පැමිණිලි සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2012 වර්ෂයේ පොලිස් වාර්තා අනුව දිනකට සිදුවූ ළමා අපයෝජනයන්හි සාමාන්‍ය අගය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2008 - 2012 කාල සීමාව තුළදී,

(i) ළමා අපයෝජන සම්බන්ධයෙන් දේශපාලනයට සම්බන්ධ පුද්ගලයින් චූදිතයන් ලෙස නම් කෙරුණු අවස්ථා තිබේද;

(ii) එසේ නම්, එවැනි අවස්ථා ගණන කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3592/’13

4.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හක්මන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකරනු ලබන බවට ජනතාව චෝදනා කරන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ අනවසරයෙන් ගොඩකර ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම අනවසර ගොඩකිරීම්වලට අදාළව පැමිණිලි ලැබී තිබේද;

(iv) එසේ නම්, ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කර තිබේද;

(vi) ඒ අනුව ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා හක්මන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ කුඹුරු ඉඩම් ගොඩකිරීමට නීත්‍යානුකූල අවසරය ලබාගෙන තිබේද;

(ii) එසේ නම්, ගොඩකිරීම සඳහා අවසර ලබා දී ඇති කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එම කුඹුරු ඉඩම් ගොඩකිරීමට අවසර ලබා දීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3913/'13

5\.
ගරු පී. හැරිසන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මැද පළාතේ,

(i) වර්ෂ 2005-2012 කාල සීමාව තුළ මියගිය සමස්ත පිළිකා රෝගීන් සංඛ්‍යාව;

(ii) එක් එක් රෝහලේදී මිය ගිය එම රෝගීන් සංඛ්‍යාව;

(iii) රජයේ රෝහල්වලින් දැනට ප්‍රතිකාර ලබන සමස්ත පිළිකා රෝගීන් සංඛ්‍යාව;

(iv) එක් එක් රජයේ රෝහලේ ප්‍රතිකාර ගනු ලබන එම රෝගීන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාතේ පිළිකා රෝගීන් සඳහා ප්‍රමාණවත් තරම් ඖෂධ තිබේද;

(ii) එම පළාතේ පිළිකා රෝගීන් සීඝ්‍රයෙන් වැඩිවී ඇති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එයට හේතු කවරේද;

(iv) එම හේතු වැළැක්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4109/'13

6\.
ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුද්ගලයන් ලියාපදිංචිකිරීමේ දෙපාර්තමේන්තුව විසින් e - NIC ව්‍යාපෘතිය වෙනුවෙන් ලංකා ලොජිස්ටික් සමාගමට එක් එක් අවස්ථාවේදී ගෙවා ඇති මුදල් ප්‍රමාණයන් කොපමණද;

(ii) එම ගෙවීම් සිදුකරන ලද දිනයන් කවරේද;

(iii) ඉහත කී ව්‍යාපෘතිය වෙනුවෙන් 2012.12.31 දින ලංකා ලොජිස්ටික් සමාගම විසින් රු. 37,649,044.00ක මුදලක් ඉල්ලා තිබේද;

(iv) එකී මුදල් ප්‍රමාණය ඉහත සමාගම වෙත ගෙවා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ලංකා ලොජිස්ටික් සමාගම විසින් e - NIC ව්‍යාපෘතියට අදාළව ලබාදී ඇති සේවාවන් සහ එම එක් එක් සේවාවට අදාළ වියදම වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) e - NIC ව්‍යාපෘතියේ සියලු කටයුතු සඳහා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීමට නියමිතව තිබියදී, අතරමැදි ආයතනයකට විශාල මුදලක් ගෙවීමට හේතුව කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4312/'13

7\.

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව පෞද්ගලීකරණය කළ වර්ෂය කවරේද;

(ii) පෞද්ගලීකරණය කරන විට රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ සේවය කරන ලද සේවකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව ආරම්භ කිරීමේදී එවකට සිටි මුදල් අමාත්‍ය ගරු ආචාර්ය ඇන්. එම්. පෙරේරා මහතා විසින් රාජ්‍ය ඉස්කාගාර සංස්ථාවේ සේවකයින් වෙනුවෙන් මහා භාණ්ඩාගාරයේ තැන්පත් කරන ලද මුදල කොපමණද;

(iv) රාජ්‍ය ඉස්කාගාර සංස්ථාව පෞද්ගලීකරණය කිරීමෙන් පසු නව සමාගමේ සේවය කිරීමට අකමැති වූ සේවකයින් අතරින් ඉල්ලා අස් වූ, අස් කරන ලද හා සේවය අතහැර ගිය සේවකයින්ට කිසියම් වන්දි මුදලක් මහා භාණ්ඩාගාරයේ තැන්පත් කරන ලද මුදලින් ලබාදීමට කටයුතු කළේද;

(v) එසේ නම්, එම එක් එක් සේවකයින් වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4321/'13

8\.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ හෙද සේවයේ මේ වන විට පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) හෙද සේවයේ පවතින එම පුරප්පාඩු ගණනය කිරීම සඳහා යොදා ගත් පදනම (රෝගීන්, රෝහල් ඇඳන් සංඛ්‍යාව හෝ වෙනත් ආදී වශයෙන්) කවරේද;

(iii) හෙද සේවය සඳහා තෝරා ගන්නා ලද පිරිසට ස්ථිර පත්වීම් දීමට පෙර කොපමණ කාල සීමාවක පුහුණුවක් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දිවයිනේ ඇති හෙද අභ්‍යාස විද්‍යාල සංඛ්‍යාව කොපමණද;

(ii) එම හෙද අභ්‍යාස විද්‍යාලයන්හි වර්ෂයක් තුළදී පුහුණුව ලබා දිය හැකි හෙද හෙදියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම අභ්‍යාස විද්‍යාලයන්හි අධ්‍යයන කාර්යය මණ්ඩලය (දේශකවරුන්) සඳහා පුරප්පාඩු පවතින්නේද;

(iv) එසේ නම්, එම පුරප්පාඩු පිරවීම පිළිබඳව අවධානය යොමු වී තිබේද;

(v) එම පුරප්පාඩු පිරවීම සිදුකරනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4410/'13

9\.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2014 වර්ෂයේ දැයට කිරුළ වැඩ සටහන යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සංවර්ධනය කරනු ලබන මාර්ග කවරේද;

(ii) එම මාර්ගයන්හි සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා ටෙන්ඩර් කැඳවීම් සිදුකර තිබේද;

(iii) එසේ නම්, එම එක් එක් මාර්ගයේ සංවර්ධනයට අදාළව ටෙන්ඩර් ප්‍රදානය කරන ලද ආයතන කවරේද;

(iv) එක් එක් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ප්‍රදානය කරන ලද ටෙන්ඩර්වලට අදාළ ගිවිසුම් ගත මුදල් ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4445/'13

10\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජ්‍යෙෂ්ඨත්වය හා කුසලතාව මත ශ්‍රී ලංකා විගණන සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ විගණන අධිකාරි තනතුරට උසස් කිරීම සඳහා 2013 වර්ෂයේ ජනවාරි මස පැවති තරග විභාගයට අදාළ කර ගත් විෂයයන් සංඛ්‍යාව, පෙනී සිටි සංඛ්‍යාව සහ ඉන් සමත් වූ සංඛ්‍යාව;

(ii) එම තනතුරට බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව සහ සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවූ සංඛ්‍යාව;

(iii) එම පිරිස සම්මුඛ පරීක්ෂණයේදී සහ ලිඛිත විභාගයේදී ලබා ගත් ලකුණු සංඛ්‍යාව;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සම්මුඛ පරීක්ෂණයේදී,

(i) ලකුණු ලබා දුන් නිර්ණායකයන් කවරේද;

(ii) ජ්‍යෙෂ්ඨත්වයට හා කුසලතාවයන්ට ලකුණු ලබා දුන් පදනම කවරේද;

(iii) පළපුරුද්ද සඳහා ලකුණු ලබාදීමේදී සලකා බැලූ කාර්යභාර නිලධාරී (Group Officer) තනතුර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබේද;

(iv) එම තනතුරට ලකුණු ලබාදීමට පදනම් කර ගත් නීති රීති සහ චක්‍රලේඛ කවරේද;

(v) සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ලකුණු 05ක් හෝ ලබාදීමේ අවස්ථාව අහිමි කිරීමට;

(vi) රාජකාරියට අදාළ වන ලෙස උපයා ගෙන ඇති වෙනත් ඉහළ අධ්‍යාපන සුදුසුකම්වලට ලකුණු ලබා නොදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4557/'13

11.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්තමානයේ සමෘද්ධි සහනාධාරය ලබන සමස්ත පිරිස කොපමණද;

(ii) එම ප්‍රතිලාභය සැබෑ දුප්පතුන්ට නොලැබී යන බවට කෙරෙන චෝදනාව පිළිගන්නේද;

(iii) සමෘද්ධිලාභියෙකුට දැනට මාසිකව ලැබෙන මුදල දරිද්‍රතා මට්ටමෙන් මිදීමට ප්‍රමාණවත් නොවන බවට පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4628/'13

12.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට ජීවන වියදම් දීමනාව ගණනය කෙරෙන ආකාරය කවරේද;

(ii) ජීවන වියදම් දීමනාවේ ඒකක අගය (ඒකකයකට රුපියල්වලින්) ගණනය කෙරෙන ආකාරය කවරේද;

(iii) ඉහත සඳහන් අගය (ඒකක අගය) අවසන් වරට ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලද්දේ කවදාද;

(iv) ඉහත කී ඒකක පිරිවැය අවසන් වරට ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමේ සිට එය සංශෝධනය කිරීමට හේතු ඇති වී තිබේද;

(v) එසේ නම්, ජීවන වියදම් දීමනාවේ නව ඒකක අගය හඳුන්වා දෙමින් ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කිරීමට උපදෙස් දෙනු ලබන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4739/'14

13.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති සමස්ත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් විදුලිය ලබා දී ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) රජය මගින් විදුලි බිල් ගෙවනු ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) සියලුම පාසල්වල විදුලි බිල් රජය මගින් ගෙවීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2506/'12

14\.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) උතුරු පළාතේ, සම්පත්නුවර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පිහිටා තිබෙන කිරිඉබ්බන්වැව විද්‍යාලයේ භෞතික සම්පත් සහ මානව සම්පත්වල ඌනතාවයන් රැසක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කිරිඉබ්බන්වැව විද්‍යාලයේ පවතින භෞතික සම්පත් හා මානව සම්පත් ඌනතාවයන් කවරේද;

(ii) එම අඩුපාඩුකම් සපුරාලීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3234/'12

15\.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ලංකා බැංකුවට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට තිබෙන ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1\.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය (සංශෝධන),— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතනය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 8 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 23 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 23 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 01002 "අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 7,000,000 සිට රු. 12,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 12,000,000 සිට රු. 20,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 24 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 24 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම, පරිවර්තන ගාස්තු හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,500,000,000 සිට රු. 2,350,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු.1,000,000,000 සිට රු.1,950,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 25 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 25 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 "රජයේ කර්මාන්තශාලාවේ කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්තශාලාව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000<br>රු. 450,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 26 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 26 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 28502 "කෘෂිකාර්මික ගොවිපල නඩත්තුව හා බීජ අලෙවිය අත්තිකාරම් ගිණුම - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 330,000,000 සිට රු. 416,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 330,000,000 සිට රු. 416,000,000 දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 27 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 27 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 ''දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව'' වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,450,000,000 සිට රු. 1,700,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |

| | | | | |
|---|---|---|---|---|
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 800,000,000 | සිට | |
| | | රු. 1,000,000,000 | දක්වා | |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 28 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 28 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "රජයේ කර්මාන්තශාලාවේ ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්තශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000 | සිට |
| | | රු. 200,000,000 | දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 20,000,000 | සිට |
| | | රු. 92,000,000 | දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.29 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 7),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය
## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2013 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා සංශෝධනය කිරීමේ උපලේඛනය.

| අනුක්‍රමික අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | රාජ්‍ය කළමණාකරන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 17301 | 2,500,000 | 2,555,000 | - | - | - | - | 1 |
| 2 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ | 25601 | - | - | 58,000,000 | 54,000,000 | - | - | 2 |
| 3 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර | 27001 | - | - | 46,000,000 | 40,000,000 | - | - | 3 |
| 4 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල | 27201 | - | - | 75,000,000 | 69,000,000 | - | - | 4 |
| 5 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුර | 27401 | - | - | 42,000,000 | 39,000,000 | - | - | 5 |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලොන්නරුව | 27501 | - | - | 20,000,000 | 17,000,000 | - | - | 6 |
| 7 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර | 27801 | - | - | 37,000,000 | 32,000,000 | - | - | 7 |
| 8 | පොලිස් දෙපාර්තමේන්තුව | 22501 | - | - | 1,250,000,000 | 1,200,000,000 | - | - | 8 |
| 9 | ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 18101 | - | - | - | - | 10,000,000 | 17,500,000 | 9 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 10 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 28801 | - | - | 100,000,000 | 97,000,000 | - | - | 10 |
| 11 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 25401 | - | - | - | - | 22,000,000 | 200,000,000 | 11 |
| 12 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 29301 | - | - | 11,000,000 | 10,200,000 | - | - | 12 |
| 13 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 11101 | - | - | 900,000,000 | 662,000,000 | - | - | 13 |
| 14 | ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය | 12201 | - | - | 3,700,000 | 3,300,000 | - | - | 14 |
| 15 | වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 17901 | - | - | 4,000,000 | 2,200,000 | - | - | 15 |
| 16 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර | 25801 | - | - | 52,000,000 | 49,000,000 | - | - | 16 |
| 17 | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 10301 | 285,000,000 | 200,000,000 | 120,000,000 | 110,000,000 | 650,000,000 | 500,000,000 | 17 |
| 18 | ශ්‍රී ලංකා යුධ හමුදාව | 22201 | - | - | 1,750,000,000 | 1,600,000,000 | - | - | 18 |
| 19 | ශ්‍රී ලංකා ගුවන් හමුදාව | 22401 | - | - | 415,000,000 | 370,000,000 | - | - | 19 |
| 20 | සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව | 32001 | - | - | 160,000,000 | 154,000,000 | - | - | 20 |
| 21 | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව | 28101 | - | - | 140,000,000 | 139,000,000 | - | - | 21 |
| 22 | උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව | 30501 | - | - | 1,000,000 | 900,000 | - | - | 22 |
| | එකතුව | | 287,500,000 | 202,555,000 | 5,184,700,000 | 4,648,600,000 | 682,000,000 | 717,500,000 | |



අත්සන් කළේ/ මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.04.25 දින
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 8),— 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 29 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 29 දරන නියමය

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍ය සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය, සරත් අමුණුගම වන මම, 2012 අංක 23 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 24702 "අත්අඩංගුවට ගන්නා ලද රාජ සන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව" වෙත පැවරි ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | | |
|---|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු.<br>රු. | 4,000,000<br>8,500,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු.<br>රු. | 15,000,000<br>19,200,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2013.12.31 වැනි දින දක්වා පමණි.)

අත්සන් කළේ/ (ආචාර්ය) සරත් අමුණුගම,
ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
සහ වැඩ බලන මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා.

2014.05.20 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

පා.106/' 10

10.

ගරු වාසුදේව නානායක්කාර මහතා

ගරු (පූජ්‍ය) එල්ලාවල මේධානන්ද හිමි

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා

ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය

ගරු හුනෛයිස් ෆාරුක් මහතා

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා

ගරු වයි. ජී. පද්මසිරි මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ආර්. දුමින්ද සිල්වා මහතා

ගරු ජානක වක්කුඹුර මහතා

ගරු උදිත් ලොකුබණ්ඩාර මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා

ගරු ඒ. එම්. චාමික බුද්ධදාස මහතා

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු දිළුම් අමුණුගම මහතා

ගරු විජිත බේරුගොඩ මහතා

ගරු ලොහාන් රත්වත්තේ මහතා

ගරු ලක්ෂ්මන් වසන්ත පෙරේරා මහතා

ගරු වී. එස්. රාධක්‍රිෂ්නන් මහතා

ගරු ජානක බණ්ඩාර මහතා

ගරු සරත් කුමාර ගුණරත්න මහතා

ගරු වී. කේ. ඉන්දික මහතා

ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා

ගරු පෙරුමාල් රාජදුරයි මහතා

ගරු ලලිත් දිසානායක මහතා

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා

ගරු ඒ. පී. ජගත් පුෂ්පකුමාර මහතා

ගරු හේමාල් ගුණසේකර මහතා

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු විජය දහනායක මහතා

ගරු තාරානාත් බස්නායක මහතා

ගරු ඩුලිප් විජේසේකර මහතා

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා

ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු ගුණරත්න වීරකෝන් මහතා

ගරු මහින්ද සමරසිංහ මහතා

ගරු අතාවුද සෙනෙවිරත්න මහතා

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඉන්දික බණ්ඩාරනායක මහතා

ගරු නිමල් විජේසිංහ මහතා

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා

ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා

ගරු ජේ. ආර්. පී. සූරියප්පෙරුම මහතා

ගරු තිස්ස කරල්លියද්ද මහතා

ගරු කමලා රණතුංග මෙනෙවිය

ගරු ෆීලික්ස් පෙරේරා මහතා

ගරු විනායගමූර්ති මුරලිදරන් මහතා

ගරු නියෝමාල් පෙරේරා මහතා

ගරු ගීතාංජන ගුණවර්ධන මහතා

ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මහත්මිය

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු මාලනී ෆොන්සේකා මහත්මිය

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා

ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා

ගරු වික්ටර් ඇන්ටනි මහතා

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා

ගරු (වෛද්‍ය) රෝහණ පුෂ්ප කුමාර මහතා

ගරු ඒ. ආර්. එම්. අබ්දුල් කාදර් මහතා

ගරු දුමින්ද දිසානායක මහතා

ගරු තිලංග සුමතිපාල මහතා

ගරු එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලා මහතා

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු දයාශ්‍රිත තිසේරා මහතා

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා

ගරු සනත් ජයසූරිය මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා ශ්‍රී ලංකා ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරමින් ක්‍රියා කිරීම පිළිබඳ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව, —

මෙම ගරු සභාවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වන ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා 2010 නොවැම්බර් මස 29 වැනි දින හා ඊට පෙර දිනයන්හිදී එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරීන් විසින් ලන්ඩන් නගරයේදී ශ්‍රී ලංකා රජයට හා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට එරෙහිව පවත්වන ලද රැස්වීම්, විරෝධතා ව්‍යාපාර, සාකච්ඡා සඳහා සෘජුව සහ / හෝ වක්‍රව සහභාගී වී ඇති බවට එකී සාකච්ඡා, විරෝධතා සඳහා සෘජුව හෝ වක්‍රව සහ/ හෝ අනුබල දී ඇති සහ අනුග්‍රහ දක්වා ඇති බවට වාර්තා ලැබී ඇති හෙයින්ද,

එකී විරෝධතාවයන් සංවිධානය කිරීමට අදාළ මූලික සාකච්ඡාවන් හා උනන්දු කිරීමේ රැස්වීම් හා ඊට අදාළ දැනුවත් කිරීම් සඳහාද පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා සෘජුව සහභාගී වී ඇති බව වාර්තාවී ඇති හෙයින්ද,

මීට පෙරද පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ එහි හිතවතුන් සමඟ විවිධ ආකාරයේ සම්බන්ධතාවයන් පවත්වාගෙන ගිය බවට කරුණු හෙළිදරව් වී ඇති බැවින්ද,

ලන්ඩනය හා යුරෝපයේ වෙනත් ප්‍රධාන නගරවල එල්.ටී.ටී.ඊ. ක්‍රියාකාරීන් සහ/ හෝ එල්.ටී.ටී.ඊ. ආධාරකරුවන් සමග ඉතා කිට්ටු සම්බන්ධතාවයක් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා පවත්වා ඇති බව හා පවත්වාගෙන යන බවට කරුණු හෙළිදරව් වී ඇති බැවින්ද,

ඉහත කී ක්‍රියාවන් එකකින් හෝ වැඩි ගණනක් තුළින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතා ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157අ ව්‍යවස්ථාව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හය වැනි සංශෝධනය හා දිවුරුම පැහැදිලිවම උල්ලංඝනය කර ඇති බව පෙනී යන හෙයින්ද,

ඉහත කී කරුණු සම්බන්ධයෙන් හා ඉහත කී කරුණුවලට අදාළව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) ජයලත් ජයවර්ධන මහතාගේ ක්‍රියා කලාපය පිළිබඳව පරීක්ෂා කර බලා මෙම ගරු සභාවට වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. තවද,—

(අ) එකී කාරක සභාවට සාමාජිකයන් නම් කිරීම හා සභාපතිවරයා පත් කිරීම කථානායකවරයා විසින් කළ යුතු බවත්,

(ආ) එකී කාරක සභාවට ස්වකීය ගණපූරණය නියම කිරීමටත්,

(ඇ) අවශ්‍ය පුද්ගලයින් කැඳවීමට හා අවශ්‍ය ලිපි ලේඛනාදිය ගෙන්වා ගැනීමට සහ

(ඈ) දිවුරුම් පිට සාක්ෂිකරුවන් විභාග කිරීමටත්

කාරක සභාවට බලය තිබිය යුතුය.

3. වරින් වර වාර්තා කිරීමටත්, පාර්ලිමේන්තු සැසිවාරය කල් තබනු ලැබුවත්, රැස්වීම් පවත්වාගෙන යාමටත්, එකී කාරක සභාවට බලය තිබිය යුතුය.

පා.107/'10

11.

ගරු කරු ජයසූරිය මහතා

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා

ගරු තිස්ස අත්තනායක මහතා

ගරු ජෝන් අමරතුංග මහතා

ගරු සුජීව සේනසිංහ මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු තලතා අතුකෝරල මහත්මිය

ගරු හරින් ප්‍රනාන්දු මහතා,— එංගලන්තයේ "හීත්‍රෝ" ගුවන් තොටුපළේ පැවති උද්ඝෝෂණ ව්‍යාපාරවලට මෙම ගරු සභාවේ කිසියම් මන්ත්‍රීවරයෙකු සම්බන්ධ වී සිටියේද යන්න සොයා බලා වාර්තා කිරීම පිණිස වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2010 දෙසැම්බර් මස 02 වැනි දින ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍ය හා ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මහතා පාර්ලිමේන්තුව හමුවේ,

"මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව දිවුරුම් දුන් මන්ත්‍රී කෙනෙක් තහනම් කළ සංවිධානයක් එක්ක නීති විරෝධී කණ්ඩායම් සමග අතිගරු ජනාධිපතිතුමා පැමිණෙන වේලාවට එංගලන්තයේ ගුවන් තොටුපළට ගිහිල්ලා අපේ රටටත්, ඒවාගේම තමන්ගේ දිවුරුම් දීමටත් විරුද්ධව වැඩ කළා නම්, ඒ මන්ත්‍රීතුමාව මේ සභාව විසින් වහාම පරීක්ෂණයකට ලක් කළ යුතුයි"

යනුවෙන් ප්‍රකාශයක් කර ඇති බැවින් ද;

ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා විසින් මතු කරන ලද කරුණු මෙම සභාවේ බරපතළ පරීක්ෂණයකට භාජනය කළ යුතු බැවින් ද;

ඉහත නම් සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන අපි,

(අ) ගරු දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමා විසින් එල්ල කරන ලද චෝදනාවේ පසුබිමට හේතු වූ කරුණු; සහ

(ආ) එංගලන්තයේ "හීත්‍රෝ" ගුවන් තොටුපළේ පැවති උද්ඝෝෂණ ව්‍යාපාරවලට මෙම ගරු සභාවේ කිසියම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සම්බන්ධ වී සිටියේ ද යන්න සොයා බලා වාර්තා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි යෝජනා කර සිටිමු.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කළ යුතු වන්නේය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව සාමාජිකයින් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(ඇ) එහි වාර්තාව එහි පළමු රැස්වීමේ සිට මාස තුනක (03) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කෙරෙන එවැනි කාල පරිච්ඡේදයක් තුළ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

3. එම කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට බලය තිබිය යුතු ය.

(ආ) සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමටද, යම් ලේඛණයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව

කල්පනා කරන ලිඛිත හෝ වාචික සාක්ෂි ලබා ගැනීමට හා භාර ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥ දැනුමක් ඇති පුද්ගලයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද බලය තිබිය යුතුය.

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමටද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද, රැස්වීම් පවත්වාගෙන යෑමටද බලය තිබිය යුතුය.

12.

ශ්‍රී ලංකා විශ්ලේෂණ රසායනාගාර සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

13.

සුසන්ත පුංචිනිලමෙ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

14.

සීමාසහිත මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

15.

ජයවික්‍රම පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

16.

වැලන්හින්න වාචිස්සර ජාත්‍යන්තර සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

17.

පියසේන ගමගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

මානසික උපප්‍රකෘති ළමා පාසලේ ශුභ සාධක සමිතිය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

අලෙවි මවුලානා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

සෙයියිද් අබ්දුර් රහ්මාන් ජිෆ්රි මව්ලානා අනුස්මරණ අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

21.

මහනුවර ධර්මරාජ විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

22.

ලක්ෂ්මන් වසන්ත පෙරේරා ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*23.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*24.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*27.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක

1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

30.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

31.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

32.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

33.

අල් ජමියාතුල් හ්හවිසියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

34.

කුමාරසිරි හෙට්ටිගේ පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

මොහාන් ලාල් ග්‍රේරු පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

වික්ටර් ඇන්ටනි අධ්‍යාපන, සමාජ, ආර්ථික සත්කාරක හා පුණ්‍යාධාර පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**